# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 825 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 17/05/2024<br>පැය 1600 |

**මාධ්‍ය නිවේදනය**

•

**රණවිරු දින සැමරුම් උත්සවය වෙනුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම.**

2024.05.19 වන දින සවස පාර්ලිමේන්තු ක්‍රීඩාංගණයේදී විරු දින සැමරුම් උත්සවය පැවැත්වීමට නියමිතව ඇති අතර ඒ සම්බන්ධයෙන් විශේෂ රථවාහන සැලැස්මක් පහත පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

ඒ අනුව 2024.05.19 වන දින සවස 0300ට පොල්දූව හංදිය සහ කියැන්හැම් හංදියෙන් පාර්ලිමේන්තු මාර්ගයට ඇතුල් වීමේ මංතීරුව සහ පිටවීමේ මංතීරුව වසා තැබීමට ක්‍රියා කරනු ලබයි.

ඉහත මාර්ගය වසා තැබෙන කාලය තුල එම මාර්ගය භාවිතා කිරීමට අපේක්ෂිත රියදුරන්ට හා මහජනතාවට පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය ඉල්ලා සිටියි.

➢ **රාජගිරිය දෙස සිට පන්නිපිටිය දෙසට ගමන් කිරිමට නියමිත රථවාහන**

- පොල්දූව හංදියෙන් බත්තරමුල්ල හංදිය දක්වා පැමිණ දකුණට හැරී පාලම් තුන, පැලවත්ත, තලවතුගොඩ හරහා පන්නිපිටිය දක්වා ගමන් කළ හැක.
- ඇතුල්කෝට්ට මාර්ගය ඔස්සේ පිටකෝට්ට හංදියෙන් වමට හැරී කිඹුලාවල තලවතුගොඩ හරහා පන්නිපිටිය දක්වා ගමන් කළ හැක.

➢ **පන්නිපිටිය දෙස සිට රාජගිරිය දෙසට ගමන් කිරීමට නියමිත රථවාහන**

- තලවතුගොඩ, පැලවත්ත,පාලම්තුන හංදිය, බත්තරමුල්ල, පොල්දූව හරහා රාජගිරිය දක්වා ගමන් කළ හැක.
- තලවතුගොඩ, කිඹුලාවල, පිටකෝට්ට හංදියෙන් ඇතුල්කොට්ට මාර්ගය ඔස්සේ රාජගිරිය දක්වා ගමන් කළ හැක.

- රාජගිරිය දෙස සිට මාලඹේ දක්වා ගමන් කිරීමට නියමිත රථ වාහන පොල්දූව හංදිය, බත්තරමුල්ල, කොස්වත්ත,තලාහේන හරහා මාලඹේ දක්වාද,

- මාලඹේ සිට රාජගිරිය දක්වා ගමන් කිරීමට නියමිත රථ වාහන තලාහේන, කොස්වත්ත, බත්තරමුල්ල, පොල්දූව හංදිය හරහා රාජගිරිය දක්වාද සාමන්‍ය පරිදි ගමන් කිරිමේ හැකියාව පවතී.

මෙම උත්සවය අවසන් වූ වහාම රථ වාහන ගමනාගමනය සඳහා මාර්ගය විවෘත කිරීමට කටයුතු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**